# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 51 — 1973 මාර්තු 16 වැනි සිකුරාද — 1973.03.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II අ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 339 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 352 |


## තනතුරු—ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට නම් පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත් වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණය කට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම් කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාමවැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදවල පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දහවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

339—බී 70839—16,240 (73/3)
B 1 ද

## ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය

### ඇබෑර්තු

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තම නම සහ ලිපිනය ලියන ලද මුද්දර කවරයක් එවීමෙන් ලබාගන්නා ඉල්ලුම් පත්‍ර මගින් අයදුම් කළයුතුය.

**1. සහකාර ඉංජිනේරු (යාන්ත්‍රික)**

**වේතන පරිමාණය.**—සියලු දීමනා අඩංගුව මසකට රු. 800—10×40—රු. 1,200

**සුදුසුකම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයක යාන්ත්‍රික ඉංජිනේරු උපාධියක් ලබා තිබිය යුතුය. ප්‍රායෝගික පුහුණුව අවසන් කළ සහ හෝ යම් කර්මාන්තායතනයක පළපුරුද්දක් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ; හෝ පිළිගත් කාර්මික ආයතනයක ඩිප්ලෝමා හෝ සමාන සහතිකයක් සමග විශාල ඉංජිනේරු ආයතනයක පරිපාලන තත්වයේ අවුරුදු 7 ක පළපුරුද්දක් ලබා තිබීම.

**2. වැඩනායක (යාන්ත්‍රික)**

**වේතන පරිමාණය.**—සියලු දීමනා අඩංගුව මසකට රු. 450—14×25—රු. 800

**සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ සමාන සහතිකයක් සමග ජේ. ටී. සී. (යාන්ත්‍රික) සහතිකය හෝ පිළිගත් කාර්මික ආයතනයක සමාන ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබිය යුතු අතර, කර්මාන්තශාලාවක හෝ වැඩ පොළක හෝ බරවාහන, සැහැල්ලු වාහන ට්‍රැක්ටර් ඩීසල් සහ පැට්‍රල් වාහන අලුත්වැඩියා කිරීම පිළිබඳ අඩුම වශයෙන් අවුරුදු 3ක පළපුරුද්දක් ලබා තිබීම; හෝ
කණිෂ්ඨ පාඨශාලා සහතිකය සහිතව කර්මාන්ත ශාලාවක හෝ වැඩ පොළක යාන්ත්‍රික වැඩ හා අලුත්වැඩියා කිරීම් පිළිබඳ අවුරුදු 12 ක පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, ඉන් අඩුම වශයෙන් අවුරුදු 5 ක් පිළිගත් විශාල කර්මාන්ත ශාලාවක හෝ වැඩපොළක හෝ පරිපාලන තත්වයේ පළපුරුද්දක් තිබීම; හෝ
පිළිගත් විශාල කර්මාන්තශාලාවක හෝ වැඩපොළක යාන්ත්‍රික වැඩ සහ අලුත්වැඩියා කිරීම් පිළිබඳ අවුරුදු 15 ක පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, ඉන් අවුරුදු 8 ක් පරිපාලන තත්ත්වයේ විය යුතුය.

**3. වැඩනායක (බොයිලේරු)**

**වේතන පරිමාණය සහ සුදුසුකම්.**—වැඩනායක (යාන්ත්‍රික) තනතුරට අදාල වේතන පරිමාණය හා සුදුසුකම් වේ. වතුර නල බොයිලේරු ක්‍රියා කිරීම, පවත්වා ගැනීම සහ ප්‍රතිසංස්කරණ කිරීම් පිළිබඳව අයදුම්කරුට අඩු වශයෙන් අවුරුදු 3 ක පළපුරුද්දක් තිබිය යුතුය.

උෂ්ණතාප බල යන්ත්‍රයක (Thermol Power Plant) අඩු වශයෙන් අවුරුද්දක පුහුණුවක් ලැබූ අයට හෝ;
තර්මඩයිනොමික්ස් (Thermodynamics) හෝ ප්‍රායෝගික උෂ්ණත්වය (Applied Heat) විෂයයක් ඇතුව ලංකා ඉංජිනේරු ආයතනයේ පළමු කොටසින් සමත්ව ඇති හෝ එකී සමාන සහතිකයක් ඇති අයට හෝ;
වතුර නල බොයිලේරු (Water Tube Boiler) ක්‍රියා කිරීම සහ පවත්වා ගැනීම් පිළිබඳ දස අවුරුද්දක පළපුරුදුකම් සහිතව 1 වැනි පන්තියේ බොයිලේරු ක්‍රියාකාරි සහතිකය ඇති අයට හෝ;
ඇන්ජින් කාමර කම්මාන්තකරු (Engine Room Artificer) හෝ ඒ හා සමාන නාවික සහ අනිකුත් යුද්ධාත්මක සේවා පිළිබඳ සුදුසුකම් ඇති අයට විශේෂත්වයක් දෙනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් වන වේතන පරිමාණවල සුදුසු පියවරකට නැඹීම පිළිබඳව සලකා බලනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් කන්තලේ, හිඟුරාන හෝ වෙනත් ස්ථානයක පිහිටි සංයුක්ත මණ්ඩලයේ ඕනෑම ආයතනයක සේවය කිරීමට ද සූදානම් විය යුතුය. ඔවුන් විසින් රජයේ ප්‍රතිපත්තියට අනුකූලව සිංහල භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් ද ලබාගත යුතුය.

රජයේ හෝ රජයේ සංස්ථාවන්හි නිලධාරීන් දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්හි ප්‍රධානීන් මගින් අයදුම් පත් එවිය යුතුය.

අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන්, සභාපති, ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය, තැ. පෙ. 1486, 651, ඇල්විටිගල මාවත, කොළඹ—5, යන ලිපිනයට 1973. 03. 31 වෙනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය.

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය,
තැ. පෙ. 1486,
651, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට.
1973 මාර්තු මස 06 වැනි දින.

3–607—73.03.16 දින අංක 51 දරන ගැසට් පත්‍රය

---

## සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ ගොවිපල කළමනාකාර තනතුරු

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ ගොවිපල කළමනාකාර තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගනු ලබන අයදුම්පත් 1973 අප්‍රේල් මස 14 වැනි දින හෝ එදිනට කලින් සෝ කොළඹ 1, තැ. පෙ. 1652, වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුයි.

**සටහන.**—(1) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(2) අයදුම්පත් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසියම් පැමිණිල්ලක් ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දින කීපය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අපේක්ෂයක් විසින්ම විඳ දරා ගත යුතුය.

2. සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා ඊට සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. තෝරා ගනු ලබන අපේක්ෂකයෝ තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්ව පත් කරනු ලබත්.

(2) තෝරාගනු ලබන අයදුම්කරුවෙකු 1972 ජනවාරි 1 වන දිනට පෙර රජය යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් දරන්නකු නම්, ඔහු පළමු කොට නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

3. වැටුප් හා දීමනා.—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේ ය.

ඒකාබද්ධ වැටුප :—වර්ෂයකට රු. 7,500—180×3—240×2 සහ රු. 8,520 (රු. 8,040 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ක්‍රියාත්මක වේ.)

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අපේක්ෂකයකුටම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(1) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ උපාධිධරයෙකු වීම; හා
බෝග වගාව පිළිබඳව පස් අවුරුදු පළපුරුද්දක් තිබීම; හෝ;

(ආ) කෘෂිකර්ම විද්‍යාලයීය පළමු වැනි හෝ දෙවැනි පන්ති සහතිකය දරන්නකු වීම ; හා
බෝග වගාව පිළිබඳ දස අවුරුදු පළපුරුද්දක් තිබීම.

**සටහන.**—ගොවිපල කළමනාකරුවෙකු වශයෙන් පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 25 ට නොඅඩු අවුරුදු 40 ට නොවැඩි විය යුතුය, (දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

(ඈ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

5. පහත සඳහන් ලියකියවිලි වලින් කීපයක් හෝ සියල්ලම ඉල්ලා සිටි විට අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කළ යුතු ය :—
(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය.

සැළකිය යුතුයි :—
බවුතීස්ම සහතිකය හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි ආධාර ලබන පාඨශාලාවන්හි ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ භාරගනු නො ලැබේ.

(ආ) උපාධි සහතික හෝ උසස් අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්, මෙයින් එකක් අධ්‍යාපනය පිළිබඳ අධ්‍යක්ෂයෙන්, විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතු ය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර.

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සටහන**

(1) අයදුම්පත් වලට කිසිම ලියවිල්ලක් හෝ එහි පිට පතක් නො ඇමිණිය යුතු ය.

(2) ඉල්ලූ අවස්ථාවකදී ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින් ගේ අයදුම්පත් ගැන සලකා බලනු නො ලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු/සංයුක්ත මණ්ඩල ප්‍රධානියා මගින් එවිය යුතු ය.

7. ඉල්ලුම්පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ඕනෑම ලියවිල්ලක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නාමට පුද්ගලිකව නො එවිය යුතු ය.

8. ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

බොරික් ද සූසා,
ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

1973 මාර්තු මස
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
තැ. පෙ. 1652,
කොළඹ 1.

ආදර්ශ අයදුම් පත්‍රය

**සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ ගොවිපළ කළමනාකාර තනතුර සඳහා අයදුම් පත්‍රය**

(අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නො ඇමිණිය යුතු ය.)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහා දැනුම් දිය යුතු ය.) :————.

3. (අ) උපන් දිනය :—
වර්ෂය :————, මාසය :————, දිනය :————.

(ආ) ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන විට නියම වයස :—
වර්ෂ :————, මාස :————, දින :————.

4. ඔබ ලංකා රට වැසියෙක් ද? පාරම්පරික රට වැසියෙක් ද? එසේ නැත් නම් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.) :————.

5. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශවයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශවයේ මී මුත්තාගේ :————.

6. (අ) ස්ත්‍රී පුරුෂභාවය:————.

(ආ) ඔබ විවාහකද, අවිවාහක ද, වැන්දඹුවක් ද යන බව :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—

(1) සිංහල :————.

(2) දෙමළ :————.

(3) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12 න් පසුව ඉගෙනීම ලැබූ පාඨශාලා, විද්‍යාල හා වෙනත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. .......... | .......... | .......... | 1. .......... | .......... | .......... |
| 2. .......... | .......... | .......... | 2. .......... | .......... | .......... |

9. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේ ද? ණය ගැතිව සිටින්නේ නම්, ඒ කොපමණකට ද? :————.

10. ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබූවෙක් ද? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

11. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම් වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතන සඳහන් කරන්න) :————.

12. දැනට නිරත රක්ෂාව හා ඊට පූර්ව කරන ලද රක්ෂාවන් :————.

(රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.)

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. .......... | .......... | .......... | .......... |
| 2. .......... | .......... | .......... | .......... |

**සැළකිය යුතුයි** :—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි 13 වැනි කොටුවේ සඳහන් කළ යුතුයි.

13. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

14. ඔබ ගැන තොරතුරු විමසිය යුතු, ඔබ හොඳට දන්නා හඳුනන පුද්ගලයන් දෙදෙනෙකු ගේ නම් සහ ලිපිනයන් ඉදිරිපත් කරන්න :—

(1) ..........................
(2) ..........................

15. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැන ගත හොත් මා නුසුදුස් සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

3-574—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය

---

**අම්පාර දිස්ත්‍රික්කයේ කරවාකු සහ නින්දවූර්පත්තු කොට්ඨාශයේ මරුදමුනෙයි ප්‍රදේශයේ මුස්ලිම් විවාහ ලේකම් ධුරය**

අම්පාර දිස්ත්‍රික්කයේ මරුදමුනෙයි ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ විවාහක මුස්ලිම් පුරුෂ පක්ෂයෙන් ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන්නාවූ අයදුම්කරුවන්ට තිබියයුතු අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කායාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කායාල, ග්‍රාමසේවක කායාල, පළාත් පාලන ආයතන කයාල, ග්‍රාමීය උසාවි, තැපැල් කායාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල සමිති, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ කායාලයන්හි ප්‍රදර්ශනය වන දැන්වීම්වල අඩංගුවේ.

3. සියලුම අයදුම්පත් මෙම කායාලයෙන් ලාබගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1973 අප්‍රේල් මස 20 වෙනි දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

සෝමසිරි මුණසිංහ,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

දිස්ත්‍රික් ලේකම් කායාලය,
අම්පාර, 1973 පෙබරවාරි මස 7 වන දින,

3-509—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය

**සංලක්ෂ්‍යය :** (1) සේවයට බඳවා ගන්නා අවස්ථාවේදී මූලික විද්‍යා උපාධියකට වඩා උසස් පී.එච්.ඩී. හෝ ඇම්.ඇස්.සී හෝ වැනි උපාධියක් ඇති නිලධාරියෙකුට ආරම්භක වැටුප වශයෙන් වාර්ෂික රු. 8,520ක් ගෙවනු ඇත.

(2) තෝරා ගනු ලැබූ අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව, ඔහුට වැටුප් පිළිබඳ අනුග්‍රහයක් දිය යුතු නම්, ආයතන අධ්‍යක්ෂකගෙන් විමසීමෙන් පසු ඔහු වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක තබනු ඇත.

4. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1973 අප්‍රේල් මස 18 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි බව,

(ඇ) ජීව විද්‍යා ක්ෂෙත්‍රයෙහි අයදුම්කරුවන් සම්බන්ධයෙන් රසායන විද්‍යාව හෝ උද්භිද විද්‍යාව අතිරේකව ඇතිව සත්ව විද්‍යාව පිළිබඳ විශේෂ දැනුමක් ලබා ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවැනි හෝ දෙවෙනි පන්තියේ ගෞරව උපාධිධරයෙකු බවට, හෝ

භෞතික සාගරික විද්‍යා ක්ෂෙත්‍රයෙහි අයදුම්කරුවන් සම්බන්ධයෙන් ශුද්ධ ගණිතය අතිරේකව භෞතික විද්‍යාව පිළිබඳව විශේෂික දැනුමක් ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවන හෝ දෙවන පන්තියේ ගෞරව උපාධියක් තිබිය යුතුයි.

5. පහත සඳහන් ලියකියවිලිවලින් එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.)

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රිසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(1) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(2) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ ධීවර අමාත්‍යාංශයේ ලේකම්ට දැනගන්නට ලැබෙනසේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම ධීවර අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අපේක්ෂකයන්ගේ අයදුම් පත් භාර ගන්නා අවසාන දින සිට සති තුනක් ඇතුළත එම අයදුම් පත ලැබුණු බව දන්වනු ලැබේ. එසේ දැන්වීමක් නො ලැබුණු විට ඒ බව වහාම ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුයි.

ධීවර අමාත්‍යාංශයේ ලේකම්.

1973 මාර්තු මස 6 වෙනි දින,
කොළඹ 3,
ධීවර අමාත්‍යාංශයේ දීය.

### ධීවර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි තනතුර

(සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ 'ධීවර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය' යන පාඨය ලියා එය ලියාපදිංචි තැපැලෙන් කොළඹ 3, තැ. පෙ. අංක 1707, ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා ස්ථානය :————.
   (1973————දිනට වයස, අවුරුදු :——, මාස :——, දින :——.
4. ජාතිය :————.
5. විවාහකද, අවිවාහක ද යන බව :————.
6. අධ්‍යාපනික සුදුසුකම් :————.
7. වෘත්තීය සුදුසුකම් :————.
8. පාසලෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.
   (සේවය භාර ගැනීමේ සහ අස්වීමේ දින සහ අස්වීමට හේතු සඳහන් කළ යුතුය.)
9. දැනට කරන රක්ෂාව :————.
10. චරිත සහතික දී ඇති පුද්ගලයින්ගේ නම් :————.
11. වෙනත් සුදුසුකම් :————.

මවිසින් මෙම අයදුම් පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද, මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් හා මෙම තනතුරට නුසුදුසු වීමටද, මේ තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව, එම වරද දැන ගන්නට ලැබුණහොත්, කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට මා බැඳී ඇති බවද මම දනිමි.

.................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3-575—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය

---

### නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය
### ප්‍රධාන ආරක්ෂක නිලධාරි තනතුර

**සුදුසුකම් හා පළපුරුද්ද.**—පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිතව ගැසට් නිලධාරි ශ්‍රේණියේ පොලිස් හෝ සන්නද්ධ සේවයේ හෝ විශාල කාර්මික/වෙළඳ ආයතනයක/රජයේ ආයතනයක ආරක්ෂක සේවයේ අවුරුදු 3ක පළපුරුද්ද,

හෝ

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය/අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) සහිතව, පොලිස් හෝ සන්නද්ධ සේවයේ හෝ විශාල කාර්මික/වෙළඳ ආයතනයක/රජයේ ආයතනයක ආරක්ෂක අංශයේ අවුරුදු 10ක පළපුරුද්ද : මින් අවුරුදු 5ක් පොලිස් පරීක්ෂක හෝ සමාන ශ්‍රේණියක විය යුතුයි. ගිනි නිවීමේ හා නිවාරණ කටයුතු හා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**වයස.**—අවුරුදු 30ට වැඩි.

**වැටුප් පරිමාණය.**—රු. 800—7×45—රු. 1,115. (සියලු දීමනා අඩංගු මාසික).

රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රජයේ දෙපාර්තමේන්තු හා රජයේ සංස්ථාවන්හි අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම් පත් සිය දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරු වැලච්චේන, ඇඹිලිපිටිය හෝ දිවයිනේ පිහිටි සංයුක්ත මණ්ඩලයේ ඕනෑම ආයතනයක සේවය කළ යුතු වනු ඇත.

මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල අයදුම්කරුගේ අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම් පත් 1973.04.07 දිනට හෝ ඊට පෙර සාමනාන්‍යාධිකාරී වෙත ලැබෙන සේ පහත ඇති ලිපිනයට එවිය යුතුය.

අයදුම් පත් තැපැලෙන් ඉල්ලුම් කරන විට තමන්ගේ ලිපිනය සහිතව මුද්දර ගැසූ දිග කවරයක් එවිය යුතුයි.

මේ සඳහා ඉල්ලුම් කළ යුත්තේ අවශ්‍ය සුදුසුකම් ඇති අය පමණකි.

සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස,
කොළඹ 2.

3-605—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය

අංකය : සාප 14 ඒ 172.

## අධ්‍යාපන අමාත්‍යාංශය

### බහු තාක්ෂණික ආයතනයෙහි යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශයේ, බහුතාක්ෂණික ආයතනයන්හි යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහතින් දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1973 අප්‍රේල් මස 07 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව), වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "බහු තාක්ෂණික ආයතනයන්හි යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුරු ස්ථිරය. තෝරාගනු ලබන අපේක්ෂකයින් දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයන් වනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයින්, පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන්නෝ නම්, තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයින්, දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නැතිනම්, මුල් වතාවේ, තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කෙරෙනු ඇත. රාජ්‍ය සේවයෙහි නියැලී ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

3. **වැටුප් සහ දීමනා.**—රු. 6,720 ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන රු. 360 ක් වාර්ෂික වැටුප් වැඩිවීම් 12 කින් රු. 11,040 දක්වා නගින ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අදාල වේ. (මීට අනුරූපව 1969.10.1 දිනට පෙර පැවති වාර්ෂික වැටුප් ක්‍රමය රු. 4,080—12×360—රු. 8,400 ක් විය.)

**සටහන :**

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධිධරයින් හෝ එම්. එස්. සී. හෝ පී. එච්. ඩී. වැනි පශ්චාත් උපාධි ලබා ඇත්තාවූ අය, වාර්ෂිකව රු. 7,800 ක ආරම්භක ඒකාබද්ධ වැටුපක් ලැබීමට හිමිකම් ලබති.

(ii) විශ්ව විද්‍යාලයක හෝ සම මට්ටමක අවුරුදු 3 ක ඉගැන්වීමේ පළපුරුද්දක් හා උපාධියක් ඇති ආධුනිකයින් භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව. රු. 7,800 ක ඒකාබද්ධ වැටුප් තලයේ තැබීමට ඉඩ ඇත. රජයේ සේවයේ දැනටමත් නියුතු වූවකු තෝරාගනු ලැබුවහොත් 1959 ජූනි මස 13 වැනි දින දරණ අංක 492 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් සංශෝධනය කරන ලද 1957 පෙබරවාරි මස 26 වැනි දින දරණ අංක 361 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ කොන්දේසි අනුව ඔහුගේ පඩිය තීරණය කෙරෙනවා ඇත.

(iii) ඒ. එම්. අයි. ඒ. එම්. අයි. ඊ. ඊ. හෝ ඒ. එම්. අයි. යාන්ත්‍රික ඉංජිනේරු (ලන්ඩන්) වැනි සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ඇත්නම් ඔවුනට වර්ෂයකට රු. 9,960 ක ආරම්භ ඒකාබද්ධ වැටුපක් හිමිවේ. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංජිනේරු උපාධි ලත් II වැනි ශ්‍රේණියේ කථිකාචාර්යවරුන් ඔවුන්ගේ ඒකාබද්ධ වැටුප් ක්‍රමයේ උපරිමය වන වර්ෂයකට රු. 11,040 ක වැටුප් පියවරට පැමිණි එක් අවුරුද්දක් එම වැටුප් පියවරෙහි සේවය කරනු ලැබුවේ නම්, ඔවුනු රු. 480 බැගින් වාර්ෂික වැටුප් වර්ධකයන් සහිතව අවුරුද්දට රු. 13,440 ක ඒකාබද්ධ වැටුප් පියවර දක්වා වැටුප් හිමිකම් ලබති.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු තහවුරු කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1973.4.7 වැනි දිනට තමාගේ වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි බව (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(සී) (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා විෂයයන් සහිතව බී.එස්සී. ඉංජිනේරු උපාධිය ලබා තිබීම, හෝ

(ii) ඒ.එම්.අයි. යාන්ත්‍රික ඉංජිනේරු I වැනි හා II වැනි කොටස්වලින් සාමාර්ථයක් ලබා තිබීම, හෝ

(iii) සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම.

(ඩී) සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් තිබීම හෝ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ඇතුළත දී සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගැනීම.

**සංලක්ෂ්‍යය :** ඉහත සුදුසුකම් ඇති අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික ආයතනයන්හි සේවයේ සිටින අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු : අධ්‍යාපන රෙගුලාසි පිළිදී උපකෘත පාසල් ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.);

(බී) උපාධි හෝ උසස් ම අධ්‍යාපනික සහතික;

(සී) චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.);

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය;

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු. (i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් එවනු ලබන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවස්ථාවේ ලැබී, ප්‍රමාදය සඳහා සැලකියයුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ පුද්ගලික නාමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ : (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි ද අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් මේ කාර්යාලයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 මාර්තු මස 6 වන දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

අංකය : සාප 14 ඒ 172.

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුයි)

**අධ්‍යාපන අමාත්‍යාංශයේ බහුතාක්ෂණික ආයතනයන්හි යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුර**

1. නම (මුලකුරු සහිතව) :————.
(මහතා/මිය/මෙනෙවිය)

2. සම්පූර්ණ නම :————.

3. රාජකාරි ලිපිනය :————.

4. පෞද්ගලික ලිපිනය :————.

5. (අ) ලාංකිකයෙක් ද යන වග :————.

(ආ) එසේ නම්, පරම්පරාවෙන් ද. ලියාපදිංචි වීමෙන් ද ? :
————.

6. උපන් දිනය :—
අවුරුද්ද :——, මාසය :——, දිනය :————.

7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස :—
අවුරුදු : ——, මාස :——, දින :————.

8. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :—

(අ) තනතුර :————.

(ආ) ස්ථිරද, තාවකාලිකද ? :————.

(ඉ) විශ්‍රාම වැටුප් සහිතද, රහිතද ? :————.

(ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :————.

(උ) දෙපාර්තමේන්තුව :————.

(ඌ) ආයතනය/සේවා ස්ථානය :————.

(එ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.

(ඒ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.

9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර (සිංහල ප්‍රවීණතාවය/දෙමළ භාෂාව පිළිබඳ ලබා ඇති සහතිකද ඇතුළත්ව) :—

| විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|
| (1) | | |
| (2) | | |
| (3) | | |
| (4) | | |

10. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :—

| සහතිකය | නිකුත්කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |
| (4) | | | |
| (5) | | | |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතන :—

| ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |
| (4) | | | |
| (5) | | | |
| (6) | | | |
| (7) | | | |

12. වෘත්තීය අධ්‍යාපනය ලද ආයතන :—

| ආයතනය | පාඨමාලාව | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

13. කලින් දැරූ තනතුරු (නියම දිනයන් දක්වමින් හරියටම පිළිවෙළම සඳහන් කරන්න) :—

| දෙපාර්තමේන්තුව/ආයතනය/සේවා ස්ථානය | තනතුර | ස්ථිරද, තාවකාලිකද | සිට | දක්වා |
|---|---|---|---|---|
| | | | | |

14. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරු වී ඇත්තේ ද ? (එසේ නම්, විස්තර දක්වන්න) :————.

15. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහකරනු ලැබුවේද ? (එසේ නම් විස්තර දක්වන්න) :————.

16. ඔබ මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේ නම් ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.

17. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

03-615—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිෂ්‍ය භට තනතුරු

ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය නාවික බලකායේ ශිෂ්‍ය භට තනතුරු සඳහා අයැදුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරාගනු ලබන අපේක්ෂකයින් ශිෂ්‍ය භටයින් ලෙස පත් කර නියමිත අභ්‍යාස කාලය සාර්ථක ලෙස සම්පූර්ණ කළ පසු ස්ථිර අධිකාරී පිරිනමනු ඇත.

3. තෝරාගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකාවේ/එතෙර පුහුණුවක් හැදෑරීම අවශ්‍ය වේ.

4. **සුදුසුකම්.**—අයදුම්කරුවන්—

(අ) ශ්‍රී ලංකා පුරවැසියන් වීම,

(ආ) 1973 ජනවාරි 1 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු; අවුරුදු 21 ට නොවැඩිවීම,

(ඇ) (i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි විෂයය ඇතුළුව එක්වරක දී විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී සහ දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන 4 ක් ලබා තිබීම. සම්මාන අතුරින් පහත සඳහන් විෂයයන් දෙකක් ඇතුළත් විය යුතුය :—

ශුද්ධ ගණිතය, ව්‍යවහාර ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව. හෝ

(ii) ඊට උසස් කිනම් විද්‍යා සුදුසුකමක්.

සටහන.—ක්‍රීඩා පිළිබඳ විශිෂ්ඨත්වයක් දක්වනු ලැබූ අපේක්ෂකයින් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඈ) වෛද්‍ය තත්ත්වය—පහත සඳහන් ශාරීරික අවශ්‍යතාවයන් අයැදුම්කරුවන් සතුව තිබිය යුතු අතර, පත්වීමට පෙර නාවික හමුදාව මගින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය :—

උස අඩි 5 අඟල් 6

බර රාත්තල් 110

පපුවේ මිණුම අඟල් 32.

(ඉ) අවිවාහක වීම—අභ්‍යාස පුහුණු කරන කාලය තුළ දී ශිෂ්‍ය භටයින්ට/මිඩ්ෂිප්මන්වරුන්ට විවාහවීමට අවසර දෙනු නොලැබේ.

5. **වැටුප් හා දීමනා.**—නාවික හමුදා වැටුප් සංග්‍රහයේ සඳහන් පරිදි නිලයට නියමිත වැටුප් හා දීමනා තෝරාගනු ලබන අපේක්ෂකයින්ට පත්වීමේ දී ගෙවනු ලැබේ.

(අ) කොමාන්ඩර් නිලයේ නිලධාරීන් දක්වා සන්නද්ධ සේවා වැටුප් කමිටුව මගින් ගෙවීමට නිර්දේශ කර දැනට ගෙවනු ලබන ඒකාබද්ධ වැටුප් පරිමාණයන් පහත සඳහන් අයුරිනි :—

| | |
|---|---|
| ශිෂ්‍ය භට ... | වර්ෂයකට රු. 5,160 බැගින් |
| මිඩ්ෂිප්මන්වරුන් ... | වර්ෂයකට රු. 5,520 බැගින් |
| වැඩබලන උප ලුතිනන් | වර්ෂයකට රු. 5,880 බැගින් |
| උප ලුතිනන් ... | වර්ෂයකට රු. 7,500 න් පටන්ගෙන අවුරුදු පතා රු. 180 බැගින් වැඩිවීම් 5 කින් යුතුව රු. 8,400 දක්වා |
| ලුතිනන් ... | වර්ෂයකට රු. 9,240 න් පටන්ගෙන අවුරුදු පතා රු. 180 බැගින් වැඩිවීම් 8 කින් යුතුව රු. 10,680 දක්වා |
| ලුතිනන් කොමාන්ඩර් ... | වර්ෂයකට රු. 11,400 න් පටන්ගෙන අවුරුදු පතා රු. 240 බැගින් වැඩිවීම් 8 කින් යුතුව රු. 13,320 දක්වා |
| කොමාන්ඩර් ... | වර්ෂයකට රු. 15,000 න් පටන්ගෙන අවුරුදු පතා ර. 360 බැගින් වැඩිවීම් 7 කින් යුතුව රු. 17,520 දක්වා |

6. සේවා කොන්දේසි :

(අ) කලින් කල සංශෝධනය කරනු ලැබූ 1950 දෙසැම්බර් 9 වැනි දින අංක 10,187 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිලධාරීන්ගේ රෙගුලාසි අනුව සේවා කොන්දේසි පාලනය වේ.

(ආ) තෝරාගනු ලබන අපේක්ෂකයින් අර්ථසාධක අරමුදල හිමිකරුවන් වන අතර රජය මගින් නිගමනය කරනු ලබන පරිදි සන්නද්ධ සේවා අර්ථසාධක අරමුදලට සිය වැටුපෙන් සියයට ප්‍රමාණයක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු නොලැබේ. කෙසේ වුවද, ශිෂ්‍ය භටයෙකු වශයෙන් පත්වීමට පෙර දින ශ්‍රී ලංකා ජනරජයේ විශ්‍රාම වැටුප් හිමිකම් සහිත තනතුරක් දරණ ලද්දේ නම් කලින් කල සංශෝධනය කරනු ලැබූ 1962 දෙසැම්බර් 7 දින අංක 13,423 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1962 නාවික හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුකූලව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ඇත.

(ඇ) ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් රාජකාරිය සඳහා හෝ පුහුණුව සඳහා ඕනෑම විටක ලෝකයේ කුමන කොටසකට වුවත් පිටත්කර යැවිය හැක.

(ඈ) නව ප්‍රවේශකයින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පනවා ඇති මෙන්ම මතුවටත් පනවනු ලබන ව්‍යවස්ථාවලට අනුකූලව ක්‍රියා කිරීමට අවශ්‍ය වේ.

(ඉ) දෙමාපියන් හෝ භාරකරුවන් විසින් මෙහි පහත 7 වැනි ඡේදයෙන් දක්වෙන අයුරින් ප්‍රකාශනයක් අත්සන් කරනු ලැබ එය අයැදුම්පත සමග එවිය යුතුය. තෝරා ගනු ලබන අපේක්ෂකයින් පත් කිරීමට පෙර ඔවුන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් ජනරජයත් සමග එම ප්‍රකාශනයේ ආකෘතියට අනුකූලව වූ බැඳුම්කරයකට ඇතුළුවීමට අවශ්‍ය වනු ඇත.

7. අයදුම්කරුගේ මව්/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

(අ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිෂ්‍යභට තනතුර සඳහා ඉල්ලුම් කළ ........................ ගේ මව/පියා/භාරකරු මම වෙමි.

(ආ) ශ්‍රී ලංකාවේ හෝ එතෙර අභ්‍යාස පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉහත නම් සඳහන් අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් පහත සඳහන් දෑ සඳහා වගකීමට මම මෙයින් පොරොන්දු වෙමි :

(i) අභ්‍යාස කාලය තුළදී අයදුම්කරුට දරන්නට සිදුවන සියළුම පෞද්ගලික වියදම් ;

(ii) ඉහත නම් සඳහන් අයදුම්කරු අභ්‍යාස කාලය තුල දී, සිය කැමැත්තෙන්ම අධිකාරි අපේක්ෂකතාවය අත් හරින්නේ නම් ඔහු වෙනුවෙන් ජනරජය වැය කළ සියළුම වියදම් ජනරජයට ආපසු ගෙවීමට ;

(iii) ඉහත නම සඳහන් අයදුම්කරු තම අභ්‍යාස කාලය තුළ දී කුමන හෝ අවධියක (විෂමාචාරය හෝ ඔහුගේ අනුදැනුම පිට වෙනයම් හේතූන් නිසා) ඔහුට අධිකාරිය පිරිනැමීම නුසුදුසු යයි බලධාරීන් විසින් දැන්වුවහොත් ජනරජය විසින් ඔහු වෙනුවෙන් වැය කළ සියළුම වියදම් ජනරජයට ආපසු ගෙවීමට.

————————,
අත්සන.

නම සහ ලිපිනය පැහැදිලි අකුරින් :

දිනය :

————————,
සාක්ෂිකරුගේ අත්සන.

නම සහ ලිපිනය පැහැදිලි අකුරින් :

දිනය :

8. අයදුම්කරුවන්ට උපදෙස් :

පහත සඳහන් කර ඇති ආකෘති පත්‍රය අනුකූලව ලිඛිත අයැදුම් පත් 1973 අප්‍රේල් 30 වැනි දිනට පෙර කොළඹ තැ. පෙ. 593, නාවික හමුදා මූලස්ථානයේ නාවික හමුදාධිපතිට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

9. රජයේ සේවයේ හෝ සංස්ථා සේවයේ යෙදී සිටින නිලධාරීන් තම දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතු අතර, තෝරාගනු ලැබුවහොත් නිලධාරියා මුදා හැරිය හැකි බවට සහතිකයක් ඉල්ලුම් පත්‍රයෙහි අඩංගු විය යුතුය.

10. පහත සඳහන් සහතිකවල පිටපත් ඉල්ලුම් පත්‍රය සමග එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) කියා සිටින අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඇ) යටත් පිරිසෙයින් අයැදුම්කරු පුද්ගලිකව හඳුනන වගකිව යුතු පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික දෙකක්. ඉන් එකක් අයැදුම්කරු අවසන් වරට ඉගෙනීම ලැබූ පාඨශාලාවේ ප්‍රධානියාගෙන් විය යුතුය.

11. ඉහත සඳහන් කොන්දේසි සපුරාලන අයැදුම්කරුවන්ගෙන් මූලික තෝරා ගැනීම කරනු ලැබේ. මූලික සම්මුඛ පරීක්ෂණයේ දී තෝරාගනු ලබන අපේක්ෂකයින්ගේ නාවික සේවය සඳහා යෝග්‍යතාවය පරීක්ෂාකර බැලීමේ විශේෂ කෞශල්‍යය පරීක්ෂණයට පෙනී සිටීම අවශ්‍ය වේ. ඉන් පසු තෝරාගනු ලබන අපේක්ෂකයින්, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් විසින් අවසාන තෝරා ගැනීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය, දිනය හා වේලාව ලියා දන්වනු ලැබේ. මෙම කරුණ වෙනුවෙන් ගමන් වියදම් ලංකාණ්ඩුව මගින් නොගෙවනවා ඇත.

ඩී. බී. ගුණසේකර,
කොමදෝරු,
වැඩ බලන නාවික හමුදාපති.

1973 මාර්තු මස 16 වැනි දින,
කොළඹ,
ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයේ දීය.

**ශ්‍රී ලංකා නාවික හමුදාව—ශිෂ්‍ය භට තනතුර සඳහා අයදුම් පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ජාතිය (ලංකා පුරවැසිභාවය පරම්පරාවෙන් ද, නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද යන්න හා ලියාපදිංචි වීමෙන් නම් සහතිකයේ අංකය හා දිනය සඳහන් කරන්න.) :————.

3. ලිපිනය :————.

4. උපන් දිනය :————.
1973 ජනවාරි 01 දිනට වයස :— අවුරුදු :——, මාස :——, දින :——.

5. ආසන්න පොලිස් ස්ථානය :————.

6. දෙමාපියන්ගේ නම්, උපන් ස්ථාන හා වර්තමාන ලිපිනයන් : ————.

| | සම්පූර්ණ නම | උපන් ස්ථානය | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

7. ඔබ විවාහකද, අවිවාහකද යන වග :————.

8. ඔබ පාසැලේ දී ලත් ක්‍රීඩා පිළිබඳ විශිෂ්ඨ සම්මාන මොනවාද ? : ————.

9. ඔබ පාසැලේ දී ලබා ඇති වෙනත් විශේෂ දක්ෂකම් මොනවාද ? :————.

10. මීට පෙර සන්නද්ධ සේවාවක, ස්වේච්ඡා භට කණ්ඩායමක, ශිෂ්‍ය භට කණ්ඩායමක හෝ බාලදක්ෂ ව්‍යාපාරයක කර ඇති සේවය :————.

11. මෙම පත්වීම සඳහා ඔබ සතුව ඇති වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද ? :————.

12. මීට පෙර කිසිම හෝ සන්නද්ධ සේවාවක ඇබෑර්තුවක් සඳහා ඔබ අයදුම්කර තිබේද ? එසේ නම් එහි ප්‍රතිඵල : ————.

13. ඔබගේ පාසැල් කාලය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :————.

| විද්‍යාලයේ නම | දිනය | | සමත්වූ ආණ්ඩුවේ විභාග සහ විෂයයන් |
|---|---|---|---|
| | ඇතුළු වීම | අස්වීම | |
| | | | |

14. විද්‍යාලයෙන් අස්වූවාට පසු නියුක්තව සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

| ස්වාමියාගේ නම | රැකියාවේ ස්වභාවය | සේවාකාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

15. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :—

(අ)————.

(ආ)————.

ඉහත සඳහන් ප්‍රශ්නවලට මා විසින් සපයා ඇති පිළිතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. ගැසට් පත්‍රයෙහි පළ කර ඇති පරිදි ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිෂ්‍ය භට තනතුරු සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් කෙරෙහි බලපාන ව්‍යවස්ථා මෙන්ම, නිලධාරීන්ගේ වැටුප් හා සේවා කොන්දේසි සහ උසස්වීමේ හැකියාවන් කෙරෙහි බලපාන සේවා කොන්දේසි ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–577—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය

---

අංකය :—සුබෝ/ආය/20.

**සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවේ අත් හදා බැලීමේ නිලධාරි තනතුරු**

1973 පෙබරවාරි මස 2 වැනි දින අංක 45 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද මගේ නිවේදනයෙහි දක්වා ඇති ඉහත සඳහන් තනතුරුවලට ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය 1973 අප්‍රේල් මස 3 වැනි දින දක්වා (එම දිනයත් ඇතුළුව) දීර්ඝ කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආචාර්ය ඊ. ජයනෙත්ති,
සුළු අපනයන භෝග අධ්‍යක්ෂ.

1973 ක් වූ මාර්තු මස 5 වැනි දින,
කොළඹ 7, අංක 159, ධර්මපාල මාවතේ,
සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවේ දී ය.

3–563—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය

---

**ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

ලේඛකාධිකාරි තනතුර/සහකාර ලේඛකාධිකාරි (පාලන තනතුර.)

ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අදාල ලියකියවිලි සහිතව, මෙම ආයතනයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රයෙහි සම්පූර්ණ විස්තර සඳහන් කර අධ්‍යක්ෂ, ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, 33, එලිබැන්ක් පාර, කොළඹ 5 යන ලිපිනයට 1973.04.05 දිනට ප්‍රථම ලැබෙන පරිදි ලේඛනගත තැපැලෙන් එවිය යුතුයි. ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරෙහි සඳහන් කළ යුතුයි.

**ලේඛකාධිකාරි තනතුර**

සුදුසුකම්.—(i) පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවෙනි හෝ දෙවෙනි පංතියේ උපාධියක් සහ ජ්‍යෙෂ්ඨ පරිපාලන/කළමනාකාරීත්ව තනතුරුවල අඩු වශයෙන් වර්ෂ 7 කට නො අඩු පළපුරුද්දක් තිබීම; හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ උපාධියක් සහ අඩු වශයෙන් අවුරුදු 10 ක ජ්‍යෙෂ්ඨ පරිපාලන/කළමනාකාරීත්ව තනතුරුවල පළපුරුද්දක් තිබීම.

(ii) ගොවිජන ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(iii) එසේම රාජ්‍ය පරිපාලනය, සංවර්ධන පරිපාලනය හෝ සංවර්ධන ක්‍රම සම්පාදනය පිළිබඳ පශ්චාත් උපාධියක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(iv) 1973. 04. 05 දිනට වයස අවු. 35 ට අඩු නො විය යුතුයි.

වේතනය.—රු. 1,500—6×75—රු. 1,950 (ඒකාබද්ධ මාසික වේතනය) සහකාර ලේඛකාධිකාරී (පාලන) තනතුර

සුදුසුකම්.—(i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ උපාධියක් සහ විධායක තනතුරුවල අවුරුදු 5 ක පළපුරුද්දක් ඇතුළුව අවුරුදු 7 ක් සේවා පළපුරුද්දක් තිබීම; හෝ

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය/අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය විෂයයන් 6 කින් එකවර සමත් වී තිබීම සහ විධායක තනතුරුවල අවුරුදු 10 ක පළපුරුද්ද සහිතව රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක අවුරුදු 15 ක සේවා පළපුරුද්දක් තිබීම.

(ii) කාර්යාල පරිපාලනය පිළිබඳව මනා දැනුමක් තිබීම අත්‍යවශ්‍ය වේ.

(iii) වයස අවුරුදු 30 ටත් 45 ටත් අතර විය යුතු වේ. මෙහි උපරිම වයස් සීමාව රජයේ/සංස්ථා සේවයේ දැනට සිටින අය කෙරෙහි බල නොපානු ඇත.

වේතනය.—රු. 650—10×30—5×45—රු. 1,175 (ඒකාබද්ධ මාසික වේතනය)

සේවා කොන්දේසි.—තෝරාගත් අයදුම්කරුවන්—

(අ) වර්ෂ 2 ක ආධුනික තත්ත්වයේ සිටිනු ඇත. රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා හා ආයතනවල ස්ථිර නිලධාරීන් වෂියක් තුල වැඩ බලනු ඇත.

(ආ) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ රෙගුලාසිවලට හා දැනට පනවා ඇති හෝ අනාගතයේ දී රජය විසින් පැනවීමට ඇති රාජ්‍ය භාෂා රෙගුලාසිවලට යටත් විය යුතුය.

(ඇ) අන්තර් ජාතීය කණ්ඩායමක සාමාජිකයකු වශයෙන් ක්‍රියා කිරීමේ හැකියාවක් තිබිය යුතුය.

(ඈ) ජාතික සුභසාධක අරමුදලට මුදල් ගෙවිය යුතු අතර 1972 අංක 5 දරණ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ දැනට පනවා ඇති හා අනාගතයේ පැනවිය හැකි රෙගුලාසිවලට යටත් විය යුතුය.

සාමාන්‍ය කොන්දේසි :

පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) පිළිගත් පුද්ගලයන් දෙදෙනකුගෙන් ලබාගත් චරිත සහතික දෙකක් ; ඉන් එකක් ඉගෙනගත් අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ/ආචාර්ය/විද්‍යාලයාධිපති/මහාචාර්යතුමාගෙන් විය යුතුය.

(ඇ) ලබාගත් ඉහළම අධ්‍යාපන සහතිකය.

(ඈ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි විෂයවලින් සමත් වූ ඉහළම විභාගය පිළිබඳ සහතිකය.

2. ඉල්ලුම් පත් ලැබුණු බවට දැනුම්දීමක් නොකරනු ඇත. මෙම දැන්වීමේ අවශ්‍යතාවලට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. අවශ්‍ය වූ විට ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

3. කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් කැඳවනු ඇත. ගමන් වියදම් හෝ වෙනත් වියදම් නොගෙවනු ඇත.

4. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයක් හා සෞඛ්‍ය තත්ත්වයක් ඇති බව ඔප්පු කළ යුතුයි.

5. දැනට රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් හැර සෙසු තෝරාගත් අපේක්ෂකයන් රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් කරනු ලබන ලංකාවේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු බව පරීක්ෂා කිරීම සඳහා සෞඛ්‍ය පරීක්ෂණයකට යටත් විය යුතුය.

6. රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/ආයතනවල සේවය කරන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ගැන සලකා බලනු ලබන්නේ මෙම තනතුරට තෝරාගතහොත් මුදා හැරීමට සූදානම් බවට නිර්දේශයක් සහිතව දෙපාර්තමේන්තු/සංස්ථා/ආයතන ප්‍රධානියා විසින් ඉදිරිපත් කළහොත් පමණි.

අධ්‍යක්ෂ,
ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු
කිරීමේ ආයතනය.

3–566—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය

### නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

### අනියම් (ඉංග්‍රීසි) ලඝු ලේඛක තනතුර

ඉහත සඳහන් දෙපාර්තමේන්තුවේ එක් අනියම් (ඉංග්‍රීසි) ලඝු ලේඛක තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කළ යුතු ඉල්ලුම් පත් 1973 මාර්තු 26 වැනි දිනට හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත ලැබෙන සේ එවිය යුතු අතර ලියුම් කවරයේ උඩ වම් කෙළවරෙහි "අනියම් (ඉංග්‍රීසි) ලඝුලේඛක තනතුර සඳහා ඉල්ලුම් පත" යනුවෙන් සඳහන් කළ යුතු ය.

2. **සේවයට බඳවා ගැනීමේ නියමයන්.**—පත්වීම පුද්ගලික අනියම් ස්වභාවයකින් යුක්ත වන අතර, තෝරා ගනු ලබන අයදුම්කරුගේ සේවය එක් දිනයක දැන්වීමකින් අවසන් කළ හැකි ය. තෝරා ගනු ලබන අයදුම්කරුට අංක 682 හා 685 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ අදාළ නොවිය යුතු අතර, භාණ්ඩාගාරයේ "එක්ස්" ශාඛා වෙහි ලියාපදිංචි කරනු ලැබීමේ අයිතිවාසිකමක් ඔහුට නොලැබෙනු ඇත.

3. අධ්‍යාපන සුදුසුකම් :—

(අ) ("අ" හෝ "ආ" නිර්දේශ පත්‍රය අනුව) ඉංග්‍රීසි විෂයයෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් සාමාර්ථයක් සහිතව දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ලබාගත් සාමාර්ථයක් ; හෝ

(ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද පාඨශාලාවකින් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථයක්.

4. වෙනත් සුදුසුකම්:—නම්,

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු බව ;

(ආ) ඉල්ලුම් පත් භාරගනු ලබන අවසාන දිනය වන විට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි බව ;

(ඇ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ ආණ්ඩුවේ සංස්ථාවක හෝ පුද්ගලික ආයතනයක ඉංග්‍රීසි ලඝුලේඛකයකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු තුනක පළපුරුද්දක් ලබා ඇති බව ; සහ

(ඈ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව

සෑම අයදුම්කරුවකු විසින්ම සතුටුදායක ලෙස ඔප්පු කළ යුතු ය.

5. **වැටුප.**—(සියලු දීමනා ඇතුළුව) දිනයකට රුපියල් දහය බැගින් ය. වැඩ කරන දින සඳහා පමණක් ගෙවීම් කරනු ලැබේ.

6. අවශ්‍ය වේගය :—

(අ) ලඝුලේඛනය—(ඉංග්‍රීසි) මිනිත්තුවකට වචන අසූවක් ;

(ආ) පිටපත් කිරීම—(ඉංග්‍රීසි) මිනිත්තුවකට වචන හතක් ; සහ

(ඇ) යතුරු ලේඛනය—(ඉංග්‍රීසි) මිනිත්තුවකට වචන තිහක් ද වේ.

7. අයදුම්කරුවන් තමන්ගේ ඉල්ලුම්පත්වලට පහත දැක්වෙන සහතික පත්වල පිටපත් (මුල් පිටපත් නොවේ) එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කරන සහතිකය ; සහ

(ඇ) චරිතය පිළිබඳව මෑතක දී ලබා ගත් සහතික පත් දෙකක්.

සටහන.—මෙම සහතික පත්වල පිටපත් ආපසු එවනු නොලැබේ.

8. නියමිත දිනයක හා වේලාවක දී සම්මුඛ පරීක්ෂණයකට සහ යෝග්‍යතා පරීක්ෂණයකට කොළඹ 12 අලුත්කඩේ දී පෙනී සිටින ලෙස කැඳවනු ලැබුවහොත් එසේ පෙනී සිටීමට අයදුම්කරුවන් සූදානම් විය යුතු ය. මේ සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් ගෙවනු නොලැබේ.

ඕ. එම්. ද අල්විස්,
නීති කෙටුම්පත් සම්පාදක.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව,
අලුත්කඩේ,
කොළඹ 12..

### ආදර්ශ අයදුම් පත

### අනියම් (ඉංග්‍රීසි) ලඝුලේඛක තනතුර

1. සම්පූර්ණ නම (ස්ත්‍රී පුරුෂ භාවය හෝ ස්ත්‍රියක නම් විවාහක ද අවිවාහකද යන වග සඳහන් කරන්න.) :————.

2. දැනට ලිපිනය :————.

3. උපන් දිනය සහ අයදුම් පත් භාරගන්නා අවසාන දිනය වන විට වයස :————.

4. පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ රටවැසියෙක් ද යන වග :————.

5. දැනට රැකියාවක නියුක්ත නම් එය :————.

6. කලින් යම් රැකියාවක නියුක්තව සිට දැනට රැකියාවක නියුක්තව නො සිටී නම් කලින් රැකියාවේ විස්තර සහ සේවය අවසන් කිරීමේ හේතුව :————.

7. අධ්‍යාපන සුදුසුකම් :————.

8. වේගය : (අ) ලඝුලේඛනය :————.
(ආ) පිටපත් කිරීම :————.
(ඇ) යතුරු ලියනය :————.

9. විශේෂ සුදුසුකම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

10. චරිතය පිළිබඳ සහතික පත් ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :———— –.
(අ) :————.
(ආ) :————.

මෙම අයදුම් පතෙහි මා විසින් සපයා ඇති විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත විස්තර කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට කලින් හෙළි වුවහොත් එයින් මා නුසුදුස්සෙකු කිරීමට හැකි බවත්, මා පත් කරනු ලැබුවායින් පසු සොයාගත හොත් කිසිම වන්දියක් නොගෙවා මගේ සේවය අවසන් කිරීමට හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–688—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය

---

අංකය : විආ/4/145.

### අධ්‍යාපන අමාත්‍යාංශය

### 1974 නවසීලන්ත පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

නවසීලන්ත රජය විසින් පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව ක්‍රමය යටතේ නවසීලන්තයේ උසස් අධ්‍යාපනික ආයතනයන්හි 1974 මාර්තු මස ආරම්භ වන අධ්‍යයන වර්ෂයේ සිට පශ්චාත් උපාධි අධ්‍යාපනය හෝ පර්යේෂණය සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් භාරගනු ලබන්නේ පහත සඳහන් අධ්‍යයන ක්ෂේත්‍රයන් සඳහා පමණකි :—

(1) කෘෂිකර්ම විද්‍යාව.
(2) උද්‍යාන විද්‍යාව.
(3) ක්ෂුද්‍ර ජීව විද්‍යාව.
(4) ආකර ශිල්පය හා ලෝහ විද්‍යාව.
(5) භූගර්භ විද්‍යාව.
(6) පශු වෛද්‍ය විද්‍යාව.
(7) සත්ව පාලනය.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍යය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම්පත් භාරගනු ලබන්නේ ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම් කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.05.16 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍රලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

**සංලක්ෂ්‍යය 2.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම්පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

**සංලක්ෂ්‍යය 3.**—එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේ ද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම් පත්, 1973.3.31 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සෙවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතුයි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන අයදුම්කරුවන් තම අයදුම් පත් ඒ ඒ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මගින් එවිය යුතුය.

17. සියළුම අයදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ
ලේකම්.

1973 මාර්තු මස 7 වැනි දා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

3–642/2—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය

1972 සහ ඉන් පසු බලපැවැත්වෙන සේ, අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ 5 වන ඡේදය පහත දැක්වෙන අන්දමට සංශෝධනය කර ඇත :—

"5 ප්‍රායෝගික පරීක්ෂණ

පහත දැක්වෙන විෂයයන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වේ :—

(i) සංගීතය (හින්දුස්ථානි)
(ii) සංගීතය (කර්ණාට)
(iii) සංගීතය (බටහිර)
(iv) ගෘහ විද්‍යාව
(v) හස්ත කර්මාන්තය (ලී වැඩ)
(vi) හස්ත කර්මාන්තය (වියම)
(vii) හස්ත කර්මාන්තය (මැටි ශිල්පය)
(viii) හස්ත කර්මාන්තය (ලෝහ වැඩ)

සියළුම අයදුම්කරුවන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණ ලිඛිත පරීක්ෂණයෙන් පසු පැවැත් වේ.

පරීක්ෂණ පවත්වන දිනය, වේලාව හා ස්ථානය ඒ ඒ පරීක්ෂකවරුන් විසින් අයදුම්කරුවන්ට දන්වනු ලැබේ."

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 පෙබරවාරි 23 දින,
කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

3–569—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය

---

අංකය : 1/102/54 (ජී).

**භාෂා පරිවර්තක සේවයේ II බණ්ඩයේ භාෂා පරිවර්තකයන් (රු. 3,864—18×144—රු. 6,456) I බණ්ඩයට (රු. 5,736—6×144 සහ 8×180—රු. 8,040) උසස්කිරීමේ යෝග්‍යතා විභාගය—1973 මැයි**

අංක 773 සහ 69.9.24 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (අ) (IV) වැනි ඡේදය අනුව භාෂා පරිවර්තක සේවයේ II බණ්ඩයේ භාෂා පරිවර්තකයන් (රු. 3,864—18×144—රු. 6,456) I බණ්ඩයට (රු. 5,736—6×144 සහ 8×180—රු. 8,040) උසස්කිරීම සඳහා යෝග්‍යතා විභාගයක් 1973 මැයි මස 12 වැනි දින කොළඹදී විභාග කොමසාරිස් විසින් පවත්වනු ලැබේ.

2. සුදුසුකම්.—(අ) රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්ගේ පාලනය යටතේ පවත්නා භාෂා පරිවර්තක සේවයේ භාෂා පරිවර්තකයන්ගේ වැටුප් ක්‍රමයේ II බණ්ඩයේ සිටින්නා වූ භාෂා පරිවර්තක සේවයේ II බණ්ඩයේ දස වර්ෂයක සේවයේ සම්පූර්ණ කළාවූත්, ස්වකීය පත්වීම්වල ස්ථිර කරනු ලැබ ඇත්තාවූත්, භාෂා පරිවර්තකයන්ට/පරිවර්තිකාවන්ට මේ විභාගය සඳහා පෙනී සිටිය හැක.

(ආ) ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් ඔවුන්ගේ සේවය සියලු අයුරින්ම සතුටුදායකයයි සහතික කළ යුතුයි. සතුටුදායක සේවය ගණන් ගැනීමේදී 1973 මැයි මස 1 වෙනි දිනට අවසන්වන අවුරුදු පහක කාලය තුළදී අපේක්ෂකයා විසින් සියලුම වේතනාධික උපයා ගෙන තිබිය යුතුය. අන්තිමට ලැබූ වැටුප් වැඩිවීමෙන් පසු සතියක වැටුපට වැඩි මුදලක් දඩ ගැසීම හෝ තරවටු කිරීමට වැඩි තිසිම දඬුවමක් ලබා සිටි නම් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුසු වන්නේ ය.

3. අයදුම්පත්.—විභාගයට ඇතුළුවීම සඳහා එවනු ලබන අයදුම්පත් 1973.4.11 දින හෝ ඊට කලින් හෝ විභාග කොමසාරිස් වෙත ලැබෙන ලෙස තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. මේ දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

මේ විභාගයට ඇතුළුවීමේ අයදුම්පතක ආදර්ශ ආකෘති පත්‍රයක් මේ නිවේදනයට යාකොට ඇත. අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් භාග ප්‍රමාණයේ ෆුල්ස්කැප් කඩදාසියක තම අයදුම්පත් පිළියෙල කොට ගත යුතුය. (මේ සඳහා වෙන අන් ප්‍රමාණයක කඩදාසි පාවිච්චි නොකළ යුතුයි.) මේ සඳහා පාවිච්චි කළ යුත්තේ එක් කඩදාසියක් පමණි. අයදුම් පත්‍රයෙහි 1 සිට 6 දක්වා කොටු පළමුවැනි පිටුවෙහිද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය සහ අත්සන පිළිබඳ සහතිකය දෙවැනි පිටුවෙහිද විය යුතුය. අයදුම්පත් නිවැරදිවද, පැහැදිලිවද, අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුයි.

අයදුම්පතට යාකොට ඇති සහතිකය අත්සන් කිරීමටත්, එය බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව ලියා ඇති බවටත් වගබලා ගැනීම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සතු යුතුකමකි.

4. හැඳින්වීමේ පත්.—අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී, තමන් ලියන සෑම විෂයයන් පාසාම, විභාගශාලාධිපතිට ඒත්තු යන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරෙන් කුමක් වුවත් භාරගනු ලැබේ :—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද හඳුනා ගැනීමේ පත්‍රය ;
(ආ) මෙම විභාග දිනයට අවුරුදු තුනකට නොවැඩි කාලයකට මෙපිට දී නිකුත් කරන ලද වලංගු ගමන් බලපත්‍රයක් ;
(ඇ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රයක් ;
(ඈ) පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක්. අයදුම්කරුගේ අත්සන එහි පසු පිටේ යොදා එම අත්සන සහ පසු පිටේ ඡායාරූපය අයදුම්කරුගේම බව දෙපාර්තමේන්තු ප්‍රධානයා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු සහතික කළ යුතුය. සහතික කරන්නාගේ නම, පදවිය, ලිපිනය හා දිනය එහි සඳහන් කළ යුතුය. මෙම ඡායාරූප පිටපත් විභාගශාලාධිපති විසින් රඳවා ගන්නවා ඇත.

5. විභාග ගාස්තු.—මීට කලින් පවත්වන ලද භාෂා පරිවර්තක සේවයේ I වැනි බණ්ඩයට උසස්කිරීමේ විභාගයට පෙනී සිටි සියලුම අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ගාස්තු ගෙවිය යුතුය. පළමු වරට මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ගාස්තු ගෙවිය යුතු නොවේ. භාෂා පරිවර්තක සේවයේ 1 වැනි ශ්‍රේණියට උසස්කිරීමේ විභාගයට මෙයට ඉහතදී පෙනී සිටි සියලුම අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් රුපියල් 25 ක් වටිනා මුද්දර ඉල්ලුම් පත්‍රවලට අලවා තමාගේ අත්සන හා දිනය යොදා ඒවා නිසි ලෙස අවලංගු කළ යුතුය. මොනම කරුණක් යටතේ වුවද මෙම මුද්දර ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවන ලද විභාග ගාස්තු වෙනත් කිසිදු විභාගයක් සඳහා මාරුකිරීමට ඉඩ දෙනු නොලැබේ.

6. විභාග පරිපාටිය.—අධ්‍යයන පොදු සහතික පත්‍රය (උසස් පෙළ) මට්ටම සහ උපාධි මට්ටම අතර තත්ත්වයකින් යුතු පැය තුනක ප්‍රශ්න පත්‍ර දෙකක් මෙම විභාගය සඳහා නියම කර ඇත.

නිර්දේශ පත්‍රිකාව සහ එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා වෙන් කරන ලද ලකුණු පහත සඳහන් පරිදි වේ :—

**ප්‍රශ්න පත්‍රය I**

| | ලකුණු |
|---|---|
| (i) සාමාන්‍ය වැදගත්කමක් දරණ ඡේදයක් සහ<br>(ii) (අ) නිල ලේඛනයකින් නැතහොත් වාර්තාවකින්<br>සහ<br>(ආ) පුවත්පතක පළවූ ලියවිල්ලකින් හෝ වාර්තාවලින් හෝ ගන්නා ලද උද්ධෘත සිංහලෙන්/දෙමළෙන්/ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම... | 100 |

**ප්‍රශ්න පත්‍රය II**

| | |
|---|---|
| (i) සාමාන්‍ය වැදගත්කමක් දරණ ඡේදයක් සහ<br>(ii) (අ) නිල ලේඛනයකින් නැතහොත් වාර්තාවකින්<br>හෝ<br>(ආ) පුවත්පතක පළවූ ලියවිල්ලකින් හෝ වාර්තාවකින් හෝ ගන්නා ලද උද්ධෘත සිංහලට/දෙමළට පරිවර්තනය කිරීම ... | 100 |

විභාගයේදී සාමාර්ථ්‍යයක් ලබාගැනීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් යටත් පිරිසෙයින් ලකුණු සියයට 50ක් අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් විසින් ලබාගත යුතුය.

7. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් විසින් පනවා ඇති ව්‍යවස්ථා හා රෙගුලාසිවලට අයැදුම්කරුවන්/අයැදුම්කාරියන් යටත් විය යුතු අතරම, එම ව්‍යවස්ථා හා රෙගුලාසි කඩ කිරීමක් සම්බන්ධයෙන්, ඔහු විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට ඔවුන් යටත් විය යුතුයි. අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් සඳහා පනවා ඇති නීති මේ නිවේදනය අග වෙනම මුද්‍රණය කර ඇත.

8. **විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—විභාග කොමසාරිස් විසින් පිළිගනු ලැබ අයදුම්පත් හිමි නිලධාරීන්ට/නිලධාරිනීන්ට විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු ලබාදිය යුතුය. මේ නිවාඩු රාජකාරි නිවාඩු මෙන් සැලකිය යුතුය. ගමන් වියදම් ගෙවනු නොලැබේ.

9. යම් අපේක්ෂකයෙකුට/අපේක්ෂිකාවකට යටත් පිරිසෙයින් විභාගය පවත්වනු ලබන දිනයට දින හතකටවත් කලින් නම ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ඒ බව අප්‍රමාදව පහත දැක්වෙන විස්තරය සමග විභාග කොමසාරිස් වෙත දැක්විය යුතුය :—

(i) විභාගයේ නම :————.

(ii) සම්පූර්ණ නම :————.

(iii) සම්පූර්ණ ලිපිනය :————.

(iv) අයදුම්පත ලියාපදිංචිකළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය සහ තැපැල්කළ දිනය :————.

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 මාර්තු මස 7 වැනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේදී ය.

**භාෂා පරිවර්තක සේවයේ (උපාධිධාරී නොවන) භාෂා පරිවර්තකයන් භාෂා පරිවර්තකයින්ගේ වැටුප් ක්‍රමයේ II ඛණ්ඩයෙන් I ඛණ්ඩයට උසස් කිරීම සඳහා පැවැත්වෙන යෝග්‍යතා විභාගය—1973 මැයි**

1. මුල් අකුරු සහිත නම (පැහැදිලි අකුරෙන්) :————.
නම් සියල්ලම සම්පූර්ණයෙන් (පැහැදිලි අකුරෙන්) :————.

2. සම්පූර්ණ කාර්යාලයීය ලිපිනය :————.

3. ඔබ සේවය කරන දෙපාර්තමේන්තුවේ නම :————.

4. භාෂා පරිවර්තක සේවයේ භාෂා පරිවර්තකයන්ගේ වැටුප් පරිමාණයේ II ඛණ්ඩයේ භාෂා පරිවර්තකයෙකු වශයෙන් පත්වූ දිනය :————.

5. ඔබ භාෂා පරිවර්තක සේවයේ දස වර්ෂයක සේවය සම්පූර්ණ කළ දිනය :————.

6. ඔබගේ පත්වීමෙහි ඔබ ස්ථිර කරනු ලැබූ දිනය :————.

7. මුද්දර කොටුව :—

| රු. 25 |
|---|

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් විසින් රු. 25 ක් වටිනා මුද්දර අලවා ඔහුගේ/ඇගේ අත්සන සහ දිනය යොදා මෙම මුද්දර අලවා ගු කළ යුතුය. මුද්දර එකපිට එක නොඇලවිය යුතුයි. (ගැසට් නිවේදනයේ 5 වැනි ඡේදය බලන්න.)

මගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට ඉහත මා විසින් කර ඇති ප්‍රකාශයන් සත්‍ය බවත්, මෙහි මා විසින් අලවා ඇති මුද්දර පාවිච්චි නොකරන ලද වලංගු ඒවා බවත්, ගෞරවපූර්වකව සහතික කරමි. මෙම විභාගයේ රෙගුලාසි පිළිපැදීමට ද මම එකඟ වෙමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ සහතිකය**

(i) මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින භාෂා පරිවර්තක සේවයේ නියුක්තව සිටින භාෂා පරිවර්තක සේවයේ (උපාධිධාරී නොවන) භාෂා පරිවර්තකයන්ගේ වැටුප් පරිමාණයේ II ඛණ්ඩයේ භාෂා පරිවර්තකයෙකු බව ද,

(ii) ඉහත සපයා ඇති විස්තර නිවැරදි බවද,

(iii) ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සැමවිටම සතුටුදායකව පැවැති බව ද,

(iv) ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවද මම සහතික කරමි.

..........................................................
අත්සන

..........................................................
(අත්සන් කරන නිලධාරියාගේ පදවි නාමය)

..................වෙනුවට.
(දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ පදවි නාමය)

දිනය :————.

**අත්සන සහතික කිරීම**

අපේක්ෂකයාගේ අත්සන සහ දිනය :————.

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයා අත්සන් කළ යුත්තේ සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලය ලත් නිලධාරියකු හෝ ඔහුගේ මාණ්ඩලික නිලධාරියෙකු ඉදිරිපිටදීය.

මගේ කාර්යාලයේ නිලධාරියෙකු සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ..................... 1973 ......... මස ... වැනි දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන :————.

නම, පදවි නාමය හා තරාතිරම :————.

ලිපිනය :————.

**3–567—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය**

**ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව**

**විභාගාපේක්ෂකයින් සඳහා නීති**

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුයි. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස් සතු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිව යුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියා සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

**නීති**

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ටද ඔහුගේ සහකාරයන්ටද අනික් විභාගාපේක්ෂකයන්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත්, හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහායි. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්නද තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුය. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකි ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම් සහ කටු වැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කරවිය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ල ම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකුසේ සළකනු ලැබීමට ද හේතු විය හැකි ය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දී යැ.

3–567—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : 1/112/5(ජී).

**යතුරු ලේඛක සේවයේ ඉහළ ශ්‍රේණියට උසස් කිරීමේ යෝග්‍යතා පරීක්ෂණය—1973 මැයි**

1973 මාර්තු මස 2 වෙනි දින හා අංක 49 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ඉහත සඳහන් විභාගය පිළිබඳව පළවූ නිවේදනය කෙරෙහි විභාග අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ අවධානය මෙයින් යොමු කරවනු ලැබේ.

2 එම නිවේදනයේ 3 වෙනි ඡේදයේ (අ) උප ඡේදයේ පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලදි:

"1973 මැයි මස 1 වෙනි දින හෝ ඊට පෙර යතුරු ලේඛක සේවයේ ස්ථිර කරන ලද 1973.05.01 වෙනි දිනට අවුරුදු හතරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට ද සහ අංක 361 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අවුරුදු පහක තාවකාලික සේවයෙන් පසු ස්ථිර යතුරු ලේඛක සේවයට අන්තර්ග්‍රහණය කරන ලද යතුරු ලේඛකයින්ට ද, 1973. 05. 01 වෙනි දිනට අවුරුදු දෙකක ස්ථිර සේවා කාලයක් ඇත්නම් ඉහත සඳහන් විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ."

3. **හැඳින්වීමේ පත්‍ර.**—තමන් විභාගයට ගන්නා එක් එක් විෂයයක් සම්බන්ධයෙන් පරිපාලකයන් සෑහීමට පත්වන පරිද්දෙන් අපේක්ෂකයන් විසින් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් කුමක් වුවද පිළිගනු ලැබේ:—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද හඳුනා ගැනීමේ පත්‍රය;
(ආ) මෙම විභාග දිනයට අවුරුදු තුනකට නොවැඩි කාලයකට මෙපිටදී නිකුත් කරන ලද වලංගු ගමන් බලපත්‍රයක්;
(ඇ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රයක්;
(ඈ) පාස්පෝට් ප්‍රමාණයේ උඩුකය ඡායාරූපයක් (අයදුම්කරුගේ අත්සන එහි පසු පිටේ යොදා එම අත්සන සහ පසු පිටෙහි ඡායාරූපය අයදුම්කරුගේම බව දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු සහතික කළ යුතුය. සහතික කරන්නාගේ නම, පදවිය, ලිපිනය හා දිනය එහි සඳහන් කළ යුතුය. මෙම ඡායාරූප පිටපත් විභාගශාලාධිපති විසින් රඳවා ගන්නවා ඇත.)

ඇතුළත්වීමේ පත්‍රිකාවට අතිරේකව ඉහත කී ලේඛනවලින් එකක් සෑම අපේක්ෂකයෙකුටම තිබිය යුතුයි. එසේ නොමැති කිසිම අපේක්ෂකයෙක් විභාගයට ඇතුළු කර ගනු නොලැබේ.

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 මාර්තු මස 05 වැනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ
ඒකාබද්ධ සේවා අංශයේ දී ය.

3–568—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

**1973 අප්‍රේල් සහ ඉන් පසු — භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව හා සත්ව විද්‍යාව**

1973 අප්‍රේල් මස පැවැත්වීමට නියමිත පූර්වෝක්ත විභාගයේ සිට, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව සහ සත්ව විද්‍යාව යන විෂයයන් සඳහා 1 වන ප්‍රශ්න පත්‍රයට නියමිත නිශ්චිත උත්තර සහිත බහු වර්ණ වර්ගයේ ප්‍රශ්න සංඛ්‍යාව 100 සිට 75 දක්වා අඩු කරන ලද බව ඉහත කී විද්‍යා විෂයයන් සඳහා අයදුම්කරුවන් ඉදිරිපත් කරන සියලුම පාසැල් ප්‍රධානීන් හා බාහිර විභාගාපේක්ෂකයින් වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ 2, විභාග දෙපාර්තමේන්තුවේදීය.

– 541—73.03.16 දින අංක 51 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න

### උපලේඛනය

### 1973

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| මාර්තු | ... | 73.03.02 සිකුරාද | ... | 73.02.21 බදාද | දවල් 12.00 |
| | | 73.03.09 සිකුරාද | ... | 73.02 28 බදාද | දවල් 12.00 |
| | | 73.03.16 සිකුරාද | ... | 73.03.07 බදාද | දවල් 12.00 |
| | | 73.03.23 සිකුරාද | ... | 73.03 14 බදාද | දවල් 12.00 |
| | | 73.03.20 සිකුරාද | ... | 73.03.21 බදාද | දවල් 12.00 |
| අප්‍රේල් | ... | 73.04.04 සිකුරාද | ... | 73.03.28 බදාද | දවල් 12.00 |
| | | 73.04.11 බදාද | ... | 73.04.04 බදාද | දවල් 12.00 |
| | | 73.04.19 බ්‍රහස්පතින්ද | ... | 73.04.11 බදාද | දවල් 12.00 |
| | | 73.04.27 සිකුරාද | ... | 73.04.18 බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1972 ඔක්තෝබර් මස 20 වැනි දින.

ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.